# අභිලාෂය ප්‍රකාශ කිරීම සඳහා ආරාධනයයි (EOI)

## වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය

## දඹුල්ල පිහිටි උෂ්ණත්ව හා ආර්ද්‍රතා පාලනය සහිත ගබඩාව පවත්වාගෙන යාම හා කළමනාකරණය සඳහා සුදුසු අස්ථිත්වයක් තෝරා ගැනීම

ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව වෙනුවෙන්, වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය විසින් වසර දහයක (10) කාලයක් සඳහා, දඹුල්ල උෂ්ණත්ව හා ආර්ද්‍රතා පාලනය සහිත ගබඩාව මෙහෙයුම් හා කළමනාකරණ කටයුතු සඳහා ප්‍රසිද්ධ දේශීය සංවිධාන හෝ කොන්සෝටියම වෙතින් අභිලාෂය ප්‍රකාශ කිරීම් (EOI) හා යෝජනා සඳහා ඉල්ලීම් (RFP) සඳහා ආරාධනා කෙරේ. උනන්දුවක් දක්වන අයවලුන් සම්පූර්ණ ආයෝජනය සඳහා තමන්ගේ මූල්‍යමය ස්ථාවරභාවය හා හැකියාව ප්‍රදර්ශණය කොට ස්ථාපිත කළ යුතුය.

දඹුල්ල ආර්ථික මධ්‍යස්ථානය අසල ස්ථාපිත කොට ඇති උෂ්ණත්ව හා ආර්ද්‍රතා පාලනය සහිත ගබඩා සංකීර්ණය, හෙක්ටෙයාර් 1.246 භූමියක ඉදිකොට ඇති අතර, කුටි හයකින් (06) සමන්විත වන අතර, නැවුම් කෘෂිකාර්මික නිෂ්පාදන දළ වශයෙන් මෙ/ටොන් 5000 ක් ගබඩා කිරීමේ පූර්ණ ධාරිතාවයෙන් යුක්තය.

දඹුල්ල උෂ්ණත්ව හා ආර්ද්‍රතා පාලනය කළ ගබඩා සංකීර්ණය මෙහෙයුම් කටයුතු සිදුකිරීම හා කළමනාකරණය සඳහා වන අරමුණු.

**මූලික අරමුණු**

- ගොවි මහතුන්ගේ නිෂ්පාදනවල සුරක්ෂිතතාවය
- මිල විචල්‍යතාවයන්ගෙන් ගොවි මහතුන් ආරක්‍ෂා කොට දීම.
- කෘෂිකාර්මික නිෂ්පාදන සඳහා නිතර සිදුවන මිල මට්ටම් වර්ධනය වීම හේතුවෙන් පාරිභෝගිකයා වෙත වන බලපෑම් පාලනය කිරීම.

**ද්විතියක අරමුණ**

- ගබඩා ඉඩකඩ බාහිර පාර්ශවයන් වෙත ලබාදීමෙන් ශ්‍රී ලංකා රජය සඳහා කුලී ආදායම් ජනනය කිරීම.

ආයෝජකයන් විසින්. කොන්ත්‍රාත් ප්‍රදානයට සුදුසුකම් ලැබීම සඳහා පහත සඳහන් අවම සුදුසුකම් නිර්ණායක සපුරාතිබිය යුතුය.

**සාමාන්‍ය පළපුරුද්ද :**
- ආහාර වර්ගීකරණයේ ගබඩාවන් මෙහෙයවීමේ හා කළමනාකරණය කිරීමේ අවම වසර දෙකක පළපුරුද්ද.

**විශේෂිත පළපුරුද්ද :**
- ආහාර වර්ගීකරණයේ උෂ්ණත්ව පාලක ගබඩා දේශීයව / ජාත්‍යන්තරව මෙහෙයවීමේ හා කළමනාකරණය කිරීමේ අවම වසරක පළපුරුද්ද.
- පවත්වාගත්, කෘෂිකර්මික පාදක නිෂ්පාදනවල අවම වාර්ෂික පිරිවැටුප් සාමාන්‍යය ශ්‍රී ලංකා රුපියල් මිලියන 100 ක් විය යුතුය.

ඉහත සුදුසුකම් සපුරාලිය හැකි හා උනන්දුවක් දක්වන අයදුම්කරුවන් විසින්, උෂ්ණත්ව හා ආර්ද්‍රතා පාලනය කළ ගබඩාවක් සම්බන්ධයෙන් මෙහෙයුම් කටයුතු හා කළමනාකරණ කටයුතු සඳහා තමන්ගේ RFP හා EOI ලේඛන ඉදිරිපත් කළ යුතුය. එසේ EOI හා RFP ලේඛන ඉදිරිපත් කිරීමට පෙර, අයදුම්කරුවන්හට, වැඩිදුර විස්තර ලබාගැනීම සඳහා, **2024 අගෝස්තු 05, 06 හා 07** යන දිනවල පෙ.ව. 9.00 හා ප.ව. 1.00 අතර කාලය තුළ අදාළ ස්ථානය පරීක්ෂා කිරීමට හැක.

අපේක්ෂිත අයදුම්කරුවන්හට, ඉංග්‍රීසි භාෂාවෙන් සකස්කළ EOI හා RFP ලේඛන, වෙළඳ අමාත්‍යාංශයෙහි නිල වෙබ් අඩවිය වන https://www.trade.gov.lk/downloads/ministry-notifications වෙතින් බාගත කළ හැක.

උනන්දුවක් දක්වන අයදුම්කරුවන් විසින්, තම EOI හා RFP අයදුම්පත්, මුද්‍ර, තබා, (මෘදු පිටපත්, PDF පිටපත්, සීඩී වශයෙන්) වෙන් වශයෙන් කවරවල බහා ලියාපදිංචි තැපැලෙන් එවීමෙන් හෝ ගෙනැවිත් භාරදීමෙන්, සභාපති, අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව, වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය, මෙසනයින් මහල, අංක 492, ආර්.ඒ. ද මෙල් මාවත, කොළඹ 03 යන ලිපිනයට **2024 අගෝස්තු 26** දින ප.ව. 3.00 පෙර ලැබීමට සැලැස්විය යුතුය. අදාළ කවරයේ වම් ඉහළ කෙළවරේ, **"දඹුල්ල ගබඩා සංකීර්ණය මෙහෙයුම් හා කළමනාකරණ කටයුතු සඳහා සුදුසු අස්තිත්වයක් තෝරා ගැනීම සඳහා EOI / RFP අයදුම්පත"** යනුවෙන් සඳහන් කළ යුතුය.

ලැබී ඇති EOI අයදුම්පත්, අදාළ භාරගැනීමේ කාලය අවසන්වූ වහාම විවෘත කරනු ලබන අතර, උනන්දුවක් දක්වන ඕනෑම අයදුම්කරුවකුහට හෝ ඔහුගේ බලයලත් නියෝජිතයකුහට එම අවස්ථාවට පැමිණ සිටීමට අවසර ඇත. සුදුසුකම්ලත් EOI අයදුම්කරුවන්ගේ RFP ලේඛන පසු දිනයක හා වේලාවකදී විවෘත කරනු ලබන අතර, එම දිනය හා වේලාවන් අදාළ අස්තිත්වයන් වෙත ලිඛිතව දැනුම් දෙනු ඇත.

මේ සම්බන්ධ පූර්ව රැස්වීමක්, **දඹුල්ල ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ශ්‍රවණාගාරයේදී 2024 අගෝස්තු 07** වන දින පෙ.ව. 11.30 ට පැවැත්වීමට නියමිතය.

යම් පැහැදිලි කර ගැනීම් අවශ්‍ය වෙතොත්, කරුණාකර, ආහාර කොමසාරිස් අමතන්න. දුරකථනය – +94 011 2304049 ඊමේල් : **foodcommissioner@gmail.com** / ප්‍රධාන ගණකාධිකාරී – 0112110577

මේ සම්බන්ධව අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුවේ තීරණය අවසන් තීරණය වේ.

**සභාපති,**
**අමාත්‍යාංශ ප්‍රසම්පාදන කමිටුව,**
**වෙළඳ, වාණිජ හා ආහාර සුරක්ෂිතතා අමාත්‍යාංශය,**
**අංක 492, ආර්. ඒ. ද මෙල් මාවත, කොළඹ 03.**

**2024-07-25**